## නිපුණතාව 7

## ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකමින් සාමයෙන් සහජීවනයෙන් ක්‍රියා කරයි.

| | |
|---|---|
| **10 ශ්‍රේණිය** | 16. බුදු සිරිතයි පරිසරයයි |
| | 17. නිරෝගී බව උතුම් ලාභයයි. |
| | 18. නිවැරදි ආහාර පරිභෝජනයෙන් සුවසේ වෙසෙමු. |
| **11 ශ්‍රේණිය** | 14. පරිසර හිතකාමී වෙමු. |
| | 15. බුදු බණ ඇසුරෙන් නිරෝගී දිවියක්. |

356. බෝසතාණන් වහන්සේ බුද්ධත්වය සඳහා තෝරාගන්නා ලද නේරංජනා නදිය පිළිබඳ දේශනා කළ සූත්‍රය කුමක්ද?

................................................................................................................................

357. ''කිං කුසල ගවේසී'' යන්න හඳුන්වන්න.

................................................................................................................................

358. බුදුරජාණන් වහන්සේට නේරංජනා නදී තීරය හා අවට වටපිටාව දුටු විට පහළ වූ අදහස කුමක්ද?

................................................................................................................................

................................................................................................................................

................................................................................................................................

359. සුජාතා සිටු දියණිය සිදුහත් බෝසාතාණනන් වහන්සේට කිරි පිඩු පූජාකළ ස්ථානය කුමක්ද?

................................................................................................................................

360. සිදුහත් බෝසතුන් වසර කීයක් දුෂ්කර ක්‍රියා කළේද?.........................................................

361. සත් සතිය නම් කරන්න.

1.............................................................................................................................

2.............................................................................................................................

3.............................................................................................................................

4.............................................................................................................................

5.............................................................................................................................

6.............................................................................................................................

7.............................................................................................................................

362. සත්සතියේ දෙවන සතිය තුල සිදුවීම කුමක්ද? ඉන් ලෝකයාට පෙන්වා දුන් මහඟු ආදර්ශය ලියා දක්වන්න.

1.......................................................... 2..........................................................

363. සයවන සතිය තුළ සිදුවූ වැදගත් සිදුවීම කුමක්ද?...............................................................

................................................................................................................................

364. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයටපත් වී ලෝකයාගේ යහපත පිණිස වසර කීයක් ධර්මය දේශනා කළේද?..........................................................................................................

365. බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය ආශ්‍රිතව වස්විසූ ස්ථානදෙකක් නම් කරන්න.

366. භද්දවග්ගිය කුමාරවරු බුදුරජාණන් වහන්සේට මුණ ගැසුනේ කුමන ස්ථානයකදීද?

367. බිම්බිසාර රජු බුදුරජාණන් වහන්සේ බැහැදකීමට පැමිණියේ උන් වහන්සේ කුමන ස්ථානයක වැඩ සිටියදීද?

368. බුදුරදුන් වහන්සේ කිඹුල්වතට වැඩිකල්හි මුල් දිනවල වාසය කළ උයන කුමක්ද?

369. ශාක්‍ය කුමාරවරුන්ගේ පැවිද්ද සිදුවුයේ කොහේදීද?

370. සුදත්ත සිටුතුමා හඳුන්වන වෙනත් නමක් ලියන්න.

371. අනේපිඬු සිටුතුමා බුදුරජාණන් වහන්සේ හමුවීමට ගිය ස්ථානය කුමක්ද?

372. බුදුරජාණන් වහන්සේ පරිසරයේ සොඳුරු බව අගය කළ අවස්ථාවක් ලියන්න.

373. බුදුන් වහන්සේ තම ආරාමය වෙත වඩින විට පිරිස නිහඬ කරවනු ලැබූ අන්‍යාගමික ශාස්තෲවරයා කවුද?

374. පරිසර පද්ධතිය තුළ වසන සතුන්ගේ ජීවිත සුරක්ෂිත කිරීමට ක්‍රියාකළ අවස්ථාවලට උදාහරණදෙකක් බුදු සිරිත ඇසුරින් දක්වන්න.

1

3

375. බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල සිදුවූ ස්ථාන නම් කරන්න.

1

2

3

376. බුදුරජාණන් වහන්සේ විසින් රෝගවැළදීමට හේතුවන කරුණු අටක් පෙන්වා දුන්නේ කාහටද? ඉන් හතරක් නම් කරන්න.

1

2

3

4

377. බුදුදහම මානසික රෝග අර්ථ දක්වන්නේ කෙසේද ? ..............................

..............................

378. මානසික දුර්වලතා බුදුදහමේ හඳුන්වන නම් තුනක් ලියන්න.

1.............................. 2.............................. 3..............................

379. බුදුරජාණන් වහන්සේ ප්‍රතිකාර කළේ කුමන රෝගවලටද?

..............................

380. සසර දුකට ප්‍රතිකාර කරන වෛද්‍යවරයා කවුද?

..............................

381. බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන්ට කායික නිරෝගීකම වෙනුවෙන් අනුදැන වදාළ කරුණු තුනක් දක්වන්න.

1..............................

2..............................

3..............................

382. ගිලන්පස යනුවෙන් බුදුදහමේ හඳුන්වන්නේ මොනවාද?

..............................

383. සිවුපසය නම් කරන්න.

..............................

384. බුදුරජාණන් පවහන්සේ ආහාර අනුභවයේදී කොසොල් රජුට දුන් උපදේශය කුමක් ද?

..............................

385. පරිසරයට සිදුවන හානිය වැළැක්වීමට බුදුරදුන් දක්වා ඇති ශික්ෂාපද වලට අදාල මිනිස් ක්‍රියාකාරකම් තුනක් නම් කරන්න.

1.............................. 2.............................. 3..............................

386. භික්ෂුන් වහන්සේලා සඳහා අනුදන වදාළ වත් 4 ක් ලියන්න.

1.............................. 2.............................. 3..............................

4..............................

387. බුදුරජාණන් වහන්සේගේ දින චරියාවෙන් සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට ගත හැකි ආදර්ශ 3ක් ලියන්න.

1.............................. 2.............................. 3..............................

388. බොහෝ කායික රෝගවලටද මානසික රෝගවලටද මුල්වන්නේ කුමක්ද?

..............................

389. ''ලාභයන් අතරින් නිරෝගී බව උතුම්ය'' යන ධම්ම පදයේ සුඛ වග්ගයට අයත් ගාථාව ලියන්න.

..............................

..............................

390. නිවැරදි ආහාර පරිභෝජනය පිළිබඳ කතා පුවත ඇතුළත් සූත්‍ර දේශනාව කුමක්ද?

..............................

391. භික්ෂුන් වහන්සේලා පිණ්ඩපාත පරිභෝජනයට පෙර ඇතිකරගත යුතු සිතිවිල්ල එනම් ප්‍රත්‍යවේක්ෂාව කුමක්ද?

---------------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------------

392. බෞද්ධ සාහිත්‍යයේ සඳහන් ගිජු ලෙස ආහාර අනුභව කරන්නන් පස් දෙනා නම් කර කෙටි අරුත සපයන්න.

1 ------------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------------

2 ------------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------------

3 ------------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------------

4 ------------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------------

5 ------------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------------

393. බුදු දහමට අනුව විනයෙහි හඳුන්වා ඇති සිරිත් විරිත් සමූහය හඳුන්වන නම කුමක් ද?

---------------------------------------------------------------------------------------------------------

394. සේඛියාවල සඳහන් ආහාර ගැනීමේ දී නොකළ යුතු ක්‍රියා හතරක් නම් කරන්න.

1 ------------------------------------------------------------------------------------------------------

2 ------------------------------------------------------------------------------------------------------

3 ------------------------------------------------------------------------------------------------------

4 ------------------------------------------------------------------------------------------------------

395. භෝජනයේ පමණ නොදන්නා තැනැත්තා පිළිබඳව ධම්මපදයේ දක්වා ඇති උපමාව කුමක්ද?

---------------------------------------------------------------------------------------------------------

396. ඕවාද ප්‍රාතිමෝක්ෂයයන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

---------------------------------------------------------------------------------------------------------

397. පරිභෝජනවාදී සමාජයඅර්ථ දක්වන්න.

---------------------------------------------------------------------------------------------------------

398. වර්තමාන කාර්ය බහුල සමාජයේ බොහෝ දෙනෙක් අනුගමනය කරන වැරදි ආහාර රටාවන් මොනවාද?

1 ------------------------------------------------------------------------------------------------------

2 ------------------------------------------------------------------------------------------------------

3 ------------------------------------------------------------------------------------------------------

4 ------------------------------------------------------------------------------------------------------

5 ..........

399. ඒවායින් සිදුවන අහිතකර ප්‍රතිඵල තුනක් ලියා දක්වන්න.

1 .......... 2 .......... 3 ..........

400. “ධම්මපදයෙහි සඳහන් සුභානුපස්සිං විහරන්තං” ගාථාව සම්පුර්ණ කර අර්ථ දක්වන්න.

..........

..........

..........

..........

..........

..........

..........

401. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගතකිරීම සඳහා අනුගමනය කළ යුතු හොඳ පුරුදු පහක් ලියන්න.

1 ..........

2 ..........

3 ..........

4 ..........

5 ..........

402. පරිසරය යන්න අර්ථ දක්වන්න. ..........

403. පරිසරය බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

1 .......... 2 ..........

404. ජීව අජීව පරිසරයට අදාළ වස්තූන් කීපයක් නම් කරන්න.

..........

405. පරිසරයේ දක්නට ලැබෙන අප විසින් රැකගත යුතු ප්‍රධාන සම්පත් තුන නම් කරන්න.

1 .......... 2 .......... 3 ..........

406. ජල දූෂණයට හේතුවමිනිස් ක්‍රියාකාරකම්තුනක් නම් කරන්න.

1 .......... 2 .......... 3 ..........

407. නිරෝගීතාවය සුරැකීම සඳහා ජලය පරිහරණය සම්බන්ධයෙන් පනවා ඇති බෞද්ධ විනය නීති තුනක් ලියන්න.

1 ..........

2 ..........

3 ..........

408. වාතය දූෂණය වන ක්‍රම පහක් ලියන්න.

1 ..........

2 ..........

3 ..........

4 ..........

5 ..........................................................................................

409. බුදුරජාණන් වහන්සේ පරිසරයට හිතකාමී වූ බවට නිදසුන්හතරක් සඳහන් කරන්න.

1 ..........................................................................................

2 ..........................................................................................

3 ..........................................................................................

4 ..........................................................................................

410. පරිසර හිතකාමී වූ, දිවාරාත්‍රී පින් වැඩෙන පින්කම් මොනවාද?

..........................................................................................

411. තුරුලතාවලින් අපේ පැවැත්මට ලැබෙන ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න.

1 ........................................... 2 ...........................................

3 ........................................... 4 ...........................................

412. පරිසරයට එරෙහිවීම නිසා ඇතිවන දුර්විපාක හතරක් නම් කරන්න.

1 ........................................... 2 ...........................................

3 ........................................... 4 ...........................................

413. පරිසරය සුරැකීමට ඔබ අනුගමනය කරන ක්‍රියාමාර්ග තුනක් යෝජනා කරන්න.

1 ........................................... 2 ...........................................

3 ...........................................

414. උපසපන් භික්ෂූන් වහන්සේලාට බුදුරජාණන් වහන්සේ විසින් පරිසරය සම්බන්ධව ලබාදුන් උපදේශයක් ලියන්න.

..........................................................................................

415. අනිමිස ලෝචන පූජාව තුළින් බුදුරදුන් ලොවට දුන් ආදර්ශදෙකක් නම් කරන්න.

1 ........................................... 2 ...........................................

416. "පරිසරය සුරැකීමට පොළඹවන ආදර්ශ පාඨ පහක් නිර්මාණය කරන්න.

1 ........................................... 2 ...........................................

3 ........................................... 4 ...........................................

5 ...........................................

417. නිරෝගීකම යන්න කෙටියෙන් අර්ථ දක්වන්න.

..........................................................................................

418. බුදුදහමේ සඳහන් උතුම්ම ලාභය කුමක්ද?

..........................................................................................

419. කායික හා මානසික රෝගාබාධයන් නැවත නූපදිනා පරිදි දුරුකොට ලබාගත හැකි අති උතුම් ආරෝග්‍ය කුමක්ද? ..........................................................................................

............

420. කායික හා මානසික නිරෝගීතාවය පිණිස පාදකවන ශික්ෂා පද දෙක ලියන්න.

1 ........................................... 2 ...........................................

421. දානාදී පින්කම් කිරීම තුළින් තමාට අත්වන සම්පත් හතරක් දක්වන්න.

1............................ 2............................ 3............................ 4............................ 5............................

422. මානසික නිරෝගීතාවය සලසන බෞද්ධ ප්‍රතිපදාව කුමක්ද?

..............................................................................................................

423. බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ වෛද්‍යවරයකුට උපමා කිරීමට බලපෑ හේතුව කුමක්ද?

..............................................................................................................

..............................................................................................................

424. ''සත්හට වන බව දුකට වෙදාණන්'' පද්‍ය පාඨය ඇතුළත් ග්‍රන්ථය හා කතුවරයා නම් කරන්න.

..............................................................................................................

425. "කෙලෙස්මල සියල්ල මුලින්ම සිඳලූ බුද්ධාදී උතුමෝ නිරෝගීව වසති" යන පාඨය අඩංගු ගාථාව සඳහන් වන්නේ කුමන ග්‍රන්ථයේද?..............................................

426. නිරෝගීව ජීවත්වීමට නම් පරිසරයට බැහැර නොකළ යුතු දේ මොනවාද?

1..............................................................................................................

2..............................................................................................................

3..............................................................................................................

427. සෙනසුන් පවත්වාගෙන යාමේ දී වත්තක්ඛන්ධකයෙහි දැක්වෙන පවිත්‍රතාවය පිළිබඳ කරුණු හතරක් නම් කරන්න.

1..............................................................................................................

2..............................................................................................................

3..............................................................................................................

4..............................................................................................................

428. "ජිගච්ඡා පරමා රෝගා" යන්නෙහි අර්ථ දක්වන්න...............................................

429. අවට පරිසරය පිරිසිදුව තබා ගැනීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

1..............................................................................................................

2..............................................................................................................

430. ආහාරයේ පමණ දැන අනුභව කිරීම නිසා ලැබෙන ප්‍රතිඵල හතරක් භද්දාලි සූත්‍රයට අනුව ලියන්න.

1.................................... 2.................................... 3....................................

4.................................... 5....................................

431. බුදුරජාණන් වහන්සේ ආහාරයේ පමණ දැන ජිවත්වනලෙසට අනුශාසනා කළ බුද්ධකාලීන රජතුමා කවුද?..............................................................

432. අධික ලෙස ආහාර ගැනීමෙන් වැළඳෙන රෝග තුනක් ලියාදක්වන්න.

1.................................... 2.................................... 3....................................

433. භික්ෂූන් වහන්සේලාගේ කායික නිරෝගීතාව සඳහා ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම පරිදි බුදුරදුන් අනුමත කළ භාවනා ඉරියව්ව ලියා දක්වන්න..............................................

434. වාරිජෝව ථලෙ ඛිත්තෝ... ගාථාව සම්පූර්ණ කර අර්ථය ලියන්න.

435. කෘත්‍රිම ආහාර දීර්ඝ කාලීන භාවිතයෙන් සිදුවන දුර්විපාක තුනක් නම් කරන්න.

1 ........................ 2 ........................ 3 ........................

## නිපුණතාව 8

## ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැදින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

| | |
|---|---|
| **10 ශ්‍රේණිය** | 19. සසුන සුරැකි සංගායනා |
| | 20. හෙළ කලාවන් සුරකිමු. |
| | 21. බෞද්ධ සාහිත්‍ය රස විඳිමු. |
| **11 ශ්‍රේණිය** | 16. නිමල දහම රැකුණු අයුරු |
| | 17. මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකික ජන ජීවිතය ඔපවත් වූ ආකාරය |
| | 18. හෙළ බොදු කලාවේ අසිරිය. |
| | 19. බුදු සමයෙන් පෝෂණය වූ සිංහල සාහිත්‍යය. |

436. ධර්ම සංගායනාවක් යනු කුමක්ද'යි පැහැදිලි කරන්න.

437. "විනයෝ නාම සාසනස්ස ආයු" යන්නෙන් කුමක් අදහස් වේද?

438. සංගායනාවක් පැවැත්වීමේ අරමුණු මොනවාද?

1 ........................

2 ........................

3 ........................

4 ........................

439. ශාසන ඉතිහාසයේ ථෙරවාදී සම්ප්‍රදාය මගින් පැවැත් වූ සංගායනා ගණන කීයද?

440. පළමුවන, දෙවන, තෙවන හා සිව්වන ථේරවාදී සංගායනා සම්බන්ධව පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| තොරතුර | 1 වන සංගායනාව | 2 වන සංගායනාව | 3 වන සංගායනාව | 4 වන සංගායනාව |
|---|---|---|---|---|
| 1. සම්බුද්ධ පරිනිර්වාණයෙන් ගතවූ කාලය | | | | |
| 2. හේතුව | | | | |
| 3. මූලිකත්වය | | | | |
| 4. පැවැත්වූ ස්ථානය | | | | |
| 5. පැවැත්වූ කාලය | | | | |
| 6. දායකත්වය | | | | |
| 7. සහභාගි වූ පිරිස | | | | |
| 8. හඳුන්වන නම | | | | |

441. පස්වන හා හයවන සංගායනා පැවැත්වූ ස්ථාන නම් කරන්න.........................................

442. ප්‍රථම ධර්ම සංගායනාවට පාදක වූ සුභද්‍ර භික්ෂුවගේ අවිනීත ප්‍රකාශය ගෙනහැර දක්වන්න.

.......................................................................................................................................

443. සූත්‍ර පිටකය අයත් නිකාය සංඛ්‍යාව නම් කර, එම නිකායන් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාමට භාරදුන් මහරහතන් වහන්සේලා නම් කරන්න.........................................

| **සූත්‍ර පිටකය** | **භාණක පරපුර** |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

444. විනය පිටකය කොටස් කීයද? ඒවා නම් කර එය භාරදුන් ප්‍රධාන මහරහතන් වහන්සේ නම් කරන්න.......................................................................................................

1 ............ 2 ............ 3 ............

4 ............ 5 ............

445. දස අකැප වස්තුව ඉදිරිපත් කළේ කවුරු විසින්ද?

............

446. දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල තුනක් ලියන්න.

1 ............

2 ............

3 ............

447. කථාවත්ථුප්පකරණයේ අඩංගු දහම් කරුණු කෙටියෙන් සඳහන් කරන්න.

............

448. කථාවත්ථුප්‍රකරණය ත්‍රිපිටකයට එකතු වූයේ කිනම් සංගායනාවකින් පසුවද?

............

449. අභිධර්මයට අයත් ප්‍රකරණ කීයද? ............

1 ............ 2 ............

3 ............ 4 ............

5 ............ 6 ............

7 ............

450. තුන්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල 3 ක් සඳහන් කරන්න.

1 ............

2 ............

3 ............

4 ............

451. තුන්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස "නවරට" සසුන් පිහිටුවීමට අදාල පහත වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රදේශය | නායකත්වය | ප්‍රථමයෙන් දෙසූ සූත්‍රය/කථා වස්තුව |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |
| 9. | | |

452. තුන්වන ධර්ම සංගීතිය පැවැත්වීමට මූලිකතම හේතුව කුමක්ද ?

............

453. ප්‍රථම වරට ධර්මය පුස්ථකාරූඪ කරන ලද්දේ කීවැනි සංගායනාවේදීද? කොහේදීද?

............

454. "පුස්ථකාරූඪ කිරීම" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

..........................................................................................................

455. පුස්තකාරූඪ කිරීමට පෙර ධර්මය හා විනය පවත්වාගෙන ආවේ කෙසේද?

..........................................................................................................

456. මුඛ පරම්පරාගතව ධර්මය හා විනය පවත්වාගෙන ආ භික්ෂු පරපුර කුමන නමකින් හැඳින්වේද?

..........................................................................................................

457. ලංකාවේ සිව්වන ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න.

1..........................................................................................................

2..........................................................................................................

3..........................................................................................................

4..........................................................................................................

458. ත්‍රිපිටක ධර්මය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යාමෙන් සිදුවිය හැකි අහිතකර ප්‍රතිඵලයක් ලියන්න..........................................................................................................

..........................................................................................................

459. බුදු දහම ව්‍යාප්ත නොවූ බටහිර රටවලට ඒ පිළිබඳව හැදෑරීමට සිව්වන ධර්ම සංගායනාව කොතෙක් දුරට උපකාරී වී ඇත්ද? උදාහරණයක් මගින් පෙන්වන්න..........................................

..........................................................................................................

460. කනිෂ්ක රජු විසින් පැවැත්වූහතරවන මහායාන සංගායනාව හැඳින්වෙන තවත් නමක් ලියන්න..........................................................................................................

461. කණිෂ්ක රජතුමා පැවැත්වූ සංගායනාවට හේතු වූ කරුණු දෙක නම් කරන්න.

1..........................................................................................................

2..........................................................................................................

462. කණිෂ්ක රජතුමා පැවැත්වූ සංගායනාවේ ප්‍රතිඵල දක්වන්න.

1..........................................................................................................

2..........................................................................................................

3..........................................................................................................

4..........................................................................................................

5..........................................................................................................

463. "ස්තූපය" යන්න හැඳින්වීමට භාවිතකරන වෙනත් නම් පහ ලියන්න.

..........................................................................................................

464. "ගර්භයේ හැඩය අනුව ස්තූප නිර්මාණය කර ඇති වර්ග හය නම් කොට අර්ථ දක්වන්න.

1..........................................................................................................

2..........................................................................................................

3..........................................................................................................

4..........................................................................................................

5..........................................................................................................

6

465. ගර්භයේ හැඩයන්ට අනුව ශ්‍රී ලංකාවේ දැකිය හැකි ස්තූප වර්ග තුනකට උදාහරණ දක්වන්න.

1

2

466. ස්තූපයක් ඇඳ එහි ප්‍රධාන අංග නම් කරන්න.

467. "චෛතියඝරය" යන්න කෙටියෙන් හඳුන්වන්න.

468. චෛතියඝර තිබූ බවට දැකගත හැකි ස්තූප තුනක් නම් කරන්න.

1 2 3

469. චෛතියඝර හෙවත් වටදාගෙය ඉදිකිරීමේ පරමාර්ථ මොනවාද?

470. ස්ථූපයේ ගර්භයට සම්බන්ධකර සිව් දිශාවට මුහුණලා ඉදිකර ඇති නිර්මාණය හඳුන්වන්නේ කුමන නමකින්ද?

471. ශ්‍රී ලංකාවේ උසස් හා කලාත්මක නිර්මාණයකින් යුතු වාහල්කඩ දැකිය හැක්කේ කුමන සිද්ධස්ථානයකද?

472. "බෝධිඝර" නම් නිර්මාණයේ අරමුණ කුමක්ද?

473. කලාත්මක බෝධිඝරයක් දැකිය හැක්කේ කවර ස්ථානයකදීද?

474. "පියගැට පෙළ" යන්න කෙටියෙන් හඳුන්වන්න.

475. "අඩ්ඩචන්දපාසාණ " යනුවෙන් හැඳින්වෙන නිර්මාණය කුමක්ද?

476. වඩාත්ම කලාත්මක සඳකඩ පහණ නිර්මාණය වී ඇත්තේ කුමන යුගයේ කුමන ස්ථානයකද ?

477. අනුරාධපුර සඳකඩ පහණෙහි ආකෘතිය කෙටියෙන් හඳුන්වන්න.

478. පොළොන්නරු යුගයේදී සඳකඩ පහණෙන් ඉවත් වූ සත්වයා හා ඉවත්වීමට බලපෑ හේතු ලියන්න.

479. මහනුවර යුගයේ සඳකඩ පහණෙහි දැකිය හැකි සුවිශේෂත්වය කුමක්ද?

480. අනුරාධපුර යුගයට අයත් සඳකඩ පහණින් භවය චක්‍රය නිරූපනය වන බව පෙන්වා දුන් මහාචාර්යවරයා කවුද ?

481. "මුරගල" යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.

482. මුරගල දැකිය හැක්කේ කුමන ස්ථානවලද?

483. මුරගල නිර්මාණය කිරිමේ අරමුණු මොනවාද?

484. මුරගල්විවිධාකරයෙන් නිර්මාණය කර ඇති ආකාර තුනක් නම් කරන්න.

1 2 3

485. පෙණය සහිත නාග රූපය, මුරගල් විකාශය දියුණුව අවස්ථාවකි. මේ පිළිබඳ වාක්‍ය දෙකක් ලියන්න.

1

2

486. කොරවක්ගල නිර්මාණය කිරීමට හේතු කුමක් ද?

487. කොරවග්ගල යන්නෙහි අර්ථය කුමක් ද?

488. කොරවක් ගල හා සම්බන්ධව දැකිය හැකි කැටයම් නම් කරන්න.

489. සිතුවම් ඇඳීමෙන්, බෞද්ධ කලා කරුවාගේ අරමුණු වූයේ කුමක්ද?

490. අනුරාධපුර යුගයේ සිතුවම් වර්තමානයේ පවා දැකගත හැකි ස්ථාන 2 ක් නම් කරන්න.

1 2

491. සීගිරි සිතුවම් හා සමාන සිතුවම් දැකගත හැක්කේ කුමන රටේ කුමන චිත්‍රද?

492. අජන්තා සිතුවම්වලට සමගාවමී ඇඳ ඇති සිතුවම් දැකගත හැක්කේ කොහේදීද ?

493. පොළොන්නරු යුගයේ පැරණි සිතුවම් ඇති ස්ථාන තුනක් නම් කරන්න.

1 2 3

494. මහ පැරකුම්බා රජු විසින් කරවන ලද ජේතවනාරාමයේ පිළිමගෙයි ගර්භයේ ඇඳ ඇති සිතුවම් මඟින් නිරූපණය කරන්නේ කුමක් ද?

495. මහනුවර යුගයේ සිතුවම් දැකගතහැකි ස්ථාන පහක් ලියන්න.

1 2 3

4 5

496. මහනුවර යුගයේ චිත්‍ර ශිල්පීන් තිදෙනෙකු නම් කරන්න.

1 2 3

497. මහනුවර යුගයේ චිත්‍රවල ඇති සුවිශේෂී ලක්ෂණ තුනක් ලියන්න.

1

2

3

498. මහනුවර චිත්‍ර කලාවේ අඛණ්ඩ චිත්‍ර ක්‍රමය යන්නෙහි අදහස කුමක් ද?

499. දේශීය සිතුවම් කලාව අභාවයට යාමට හේතුව කුමක් ද?

500. දේශීය චිත්‍ර කලාවේ නව පරිච්ඡේදයක් ආරම්භ වන්නේ කිනම් වකවානුවක ද ?

501. යුරෝපීය සිතුවම කලාවේ ආභාසයෙන් බිහි වූ චිත්‍ර ශිල්පීන් දෙදෙනෙක් නම් කරන්න.

1 2

502. එම චිත්‍ර ශිල්පීන් දෙදෙනා විසින් අඳින ලද සිතුවම් දැක ගතහැකි ස්ථාන දෙක බැගින් ලියන්න.

1

2

503. කැලණි නව විහාර මන්දිරයේ සිතුවම් අඳින ලද චිත්‍ර ශිල්පියා නම් කරන්න.

504. එම චිත්‍ර ඇඳීමට මග පෙන්වූ ශිල්පියා කවුද?

505. බොරැල්ල ගෝතමී විහාරයේ සිතුවම් ඇඳි ශිල්පියා කවුද?

506. සේදවත්ත වෙහෙර ගොඩනැගිල්ලේ සිතුවම් අඳින ලද ශිල්පියා කවුද?

507. එම චිත්‍ර ශිල්පියාගේ සිතුවම්වලින් හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණ මොනවාද?

508. බෙල්ලන්විල රජමහා විහාරයේ මෑත භාගයේ ඉදිකළ විහාර මන්දිරයේ සිතුවම් ඇඳි ශිල්පියා කවුද?

509. චිත්‍ර, මූර්ති, කැටයම් වලින් අපේ බෞද්ධ කලා ශිල්ප තුළින් සාධනය කරගැනීමට අපේක්ෂිත අරමුණු තුනක් ලියන්න.

1

2

3

510. ශ්‍රී ලාංකීය බෞද්ධ කලා ශිල්ප විනාශවීමට බලපා ඇති හේතු තුනක් ලියන්න.

1 2

3

511. බෞද්ධ කලා ශිල්ප ආරක්ෂා කර ගැනීමට ඔබට කළ හැකි දේ මොනවාද?

512. බුදු පිළිම නෙළීමට පෙර බුදුන් වහන්සේ වෙනුවට වන්දනා කළ විවිධ සංකේත මොනවාද?

513. මුල් අවධියේ කලාකරුවා බුදු පිළිම නෙළීමට මැලිවූයේ ඇයි?

514. මුල්ම බුද්ධ ප්‍රතිමාව නිර්මාණය වන්නේ කිනම් රජු දවසද? කිනම් කාලයේදීද? නිදසුනක් දක්වන්න.

515. බුදු පිළිම නිර්මාණයේදී යොදාගත් මාධ්‍ය පහක් දක්වන්න.

516. බුදු පිළිම නිර්මාණය කළ ප්‍රධාන වර්ගතුන නම් කරන්න.

517. ආබද්ධ පිළිම හා අනාබද්ධ පිළිම යන්න අර්ථ දක්වන්න.උදාහරණ ලියන්න.

518. බුදු පිළිමවලදක්නට ලැබෙන මුද්‍රාවල සංකේතාත්මක අර්ථය දක්වන්න.

519. බුද්ධ ප්‍රතිමා කලාවේ ආසන යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

520. එබඳු ආසන කීයද?

521. එකී ආසනවල ඉරියවු වෙන වෙනම දක්වන්න.

522. ප්‍රතිමා ගෘහ යනු කුමක් ද?

523. පටිමාඝර වර්ගකීයද?ඒවා නම් කරන්න.

1 2 3

524. එකී පටිමාඝර වෙන වෙනම හඳුන්වා උදාහරණ දක්වන්න.

525. මහින්දාගමනයෙන් ලත් දායාද පහක් ලියන්න.

1 2 3

4 5

526. මහින්දාගමනයෙන් හා දුමින්දාගමනයෙන් ලත් ශාසනික ප්‍රවණතා තුනක් ලියන්න.

1

2

3

527. සංඝමිත්තා තෙරණිය මෙරටට වැඩමවීමේ ප්‍රධාන අරමුණු කුමක් ද?

528. බුදු දහමේ ආභාසයෙන් ලක්දිව බිහිවූ කලා නිර්මාණවලට නිදසුන් හතරක් දක්වන්න.

1 2

3 4

529. සිංහල අක්ෂර මාලාව සකස් කරන ලද්දේ කුමන භාෂාවේ ආභාසයෙන්ද?

530. මුල් අවධියේ ත්‍රිපිටකය සඳහා රචනා කළ සිංහල අටුවා තුනක් ලියන්න.

1 2 3

531. අනුරාධපුර යුගයේ ගද්‍ය, පද්‍ය නිර්මාණ සඳහා මූලාශ්‍ර වූ බෞද්ධ ග්‍රන්ථ මොනවාද?

532. පැරණි රජදරුවන් රාජ්‍ය පාලනයේදී අනුගමනය කළ යුතු ධාර්මික ප්‍රතිපත්ති දෙකක් ලියන්න.

1 2

533. පැරණි රජදරුවන් ශාසන අභිවෘද්ධියට සිදුකරන ලද සේවාවන් තුනක් නම් කරන්න.

1 ........................ 2 ........................ 3 ........................

534. මහින්දාගමනය පෙර පැවති ඇදහිලි හා විශ්වාස තුනක් නම් කරන්න.

1 ........................ 2 ........................ 3 ........................

535. මහින්දාගමනයත් සමගපැවති සමාජය බෞද්ධ මුහුණුවරක් ගත් අයුරු දක්වන්න.

1 ........................

2 ........................

3 ........................

536. මෙරට ඉතිහාසයේ මුල්ම යුගය වන අනුරාධපුර යුගයේ රචිත යැයි සැලකෙන කෘති නම් කරන්න.

........................

........................

537. ලබාදී ඇති සාහිත්‍ය කෘති ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

අමාවතුර, කව්සිළුමිණ, ධර්ම ප්‍රදීපිකාව, පූජාවලිය, මුවදෙව්දාවත, සසදාවත, බුත්සරණ, දහම් සරණ, සඟසරණ, සද්ධර්ම රත්නාවලිය

| යුගය | කෘතිය | රචකයා |
|---|---|---|
| 1. | | |
| 2. | | |

538. අමාවතුර ග්‍රන්ථය තුළින් බුදුන් වහන්සේගේ කිනම් ගුණයක් ප්‍රකාශවේද?

........................

539. 1. ධර්ම ප්‍රදීපිකාව රචනා කළේ කුමන ග්‍රන්ථයක් පසුබිම් කරගෙනද ?

........................

2. එහි ඇතුලත් වන්නේ කුමන කරුණුද ?

........................

540. බුත්සරණ නම ඒ ග්‍රන්ථයටයොදා ඇත්තේ ඇයි?........................

........................

541. එම කෘතියෙන් බුදුරජාණන් වහන්සේගේ කවර ගුණයක් ප්‍රකාශ වේද?

........................

542. දඹදෙණි යුගය ගද්‍ය පද්‍ය සාහිත්‍යයෙන් වැදගත් වීමට හේතුවූ කරුණු දෙකක් ලියන්න.

1 ........................

2 ........................

The National e-Learning Portal for The General Education

543. මුවදෙව්දාව හා සසදාවත රචනා කිරීමට මුල්වූ ජාතක කතා දෙක පිළිවෙලින් නම් කරන්න.

..........................................................................................................

544. පූජාවලියේරචනා කර ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ කුමන ගුණයද?

..........................................................................................................

545. පූජාවලියේපරිච්ඡේදවල දක්වන විස්තර සඳහන් කරන්න.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

546. පූජාවලිය යනුවෙන් එම ග්‍රන්ථයට නම ලැබීමට හේතුව කුමක්ද?

..........................................................................................................

547. සද්ධර්මරත්නාවලිය යන්නෙහි අර්ථය ලියන්න. ..........................................

..........................................................................................................

548. සද්ධර්මරත්නාවලිය රචනා වූයේ කුමන ග්‍රන්ථයක් ඇසුරු කරගෙනද? ..........................

..........................................................................................................

549. සද්ධර්මරත්නාවලිය රචනා කිරීමේ අරමුණ කුමක්ද? ..........................................

..........................................................................................................

550. සද්ධර්ම රත්නාවලියේ සෑම කතා වස්තුවකින්ම පුද්ගලයාට දෙන පණිවිඩය දක්වන්න.

..........................................................................................................

551. සද්ධර්මරත්නාවලිය පිළිබඳ මාර්ටින් වික්‍රමසිංහ මහතා දක්වා ඇත්තේ කුමන අදහසක්ද?

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

552. දහම් සරණ යන්නට එම නම යෙදී ඇත්තේ ඇයි? ..........................................

..........................................................................................................

553. දහම් සරණ ලිවීම පිළිබඳ විද්වත් මතය ගෙනහැර දක්වන්න.

..........................................................................................................

..........................................................................................................

554. සඟ සරණ කෘතියේ ඇතුළත් වී ඇත්තේ කවර තොරතුරුද?

..........................................................................................................

555. 1. සිංහලයේ විශිෂ්ටතම එකම මහා කාව්‍ය ලෙස හඳුන්වන කෘතිය කුමක් ද?

..........................................................................................................

2. එහි කතුවරයා කවුද ? ..........................................................................

3. රචනා වූ යුගය හා එම කෘතිය තේමා කරගත් ජාතකය සඳහන් කරන්න.

..........................................................................................................

556. කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ යුගවල රචිත වූ සාහිත්‍ය කෘති තුන බැගින් සඳහන් කරන්න.

| යුගය | ග්‍රන්ථය | | කතුවරයා | වස්තු විෂය |
|---|---|---|---|---|
| | ගද්‍ය | පද්‍ය | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

557. කෝට්ටේ සාහිත්‍ය යුගයේ වැඩසිටි උගත් යතිවරයන් දෙදෙනෙකු නම්කර රචනා කළ කෘති වෙන වෙනම දක්වන්න.

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

558. මහනුවර යුගය වන විට ලංකාවේ භික්ෂු අධ්‍යාපනය පිරිහීමට බලපෑ හේතු දක්වන්න.

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

559. පිරිහී ගිය බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීමට මූලික වූ බෞද්ධ යතිවරු දෙදෙනෙකු නම් කරඑම භික්ෂූන් වහන්සේලාගෙන් මූලිකත්වයෙන් ඇරඹුන පිරිවෙන් දෙක වෙන වෙනම නම් කරන්න.

1 ---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------

2 ---------------------------------------------------------------------------

---------------------------------------------------------------------------